**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

# තිරසර සංවර්ධන සභාව

## පුරප්පාඩු

2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත යටතේ ස්ථාපිත තිරසර සංවර්ධන සභාවේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වන පහත සුදුසුකම් සපුරන අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තිරසර සංවර්ධන නිලධාරී - iii ශ්‍රේණිය (පුරප්පාඩු - 06)

**සේවා ගණය : ආශ්‍රිත නිලධාරී (MA-03)**

| **අවශ්‍ය සුදුසුකම් :** | **වැටුප :** |
|---|---|
| පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, ස්වභාවික විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, හෝ කළමනාකරණ විෂයයන්හි උපාධියක් ලබා තිබීම.<br>**වෙනත්**<br>● වයස අවු. 22 සිට 45 අතර විය යුතුය.<br>● ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.<br>● යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.<br>● විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.<br>● ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. | MA3-53,940-10X800-11X1190-10X1320-5X1350-94,980 සහ ජීවන වියදම් දීමනාව හිමිවේ.<br>(ස්ථිර සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත) |

**තනතුරට පැවරෙන ප්‍රධාන කාර්යයන් :**

- තිරසර සංවර්ධනය සඳහා සම්පත් හා මූල්‍ය පහසුකම් සැපයීම සම්බන්ධීකරණය
- සන්නිවේදනය සහ උපදේශන සම්බන්ධීකරණය, දත්ත අධීක්ෂණය සහ වාර්තා සකස් කිරීම
- ජ්‍යෙෂ්ඨ කළමනාකාර කළමනාකාර මට්ටම්වල කාර්යභාරයට සහය වන විමර්ශන/ තොරතුරු හා දත්ත රැස්කිරීම, විශ්ලේෂණය, වාර්තා සම්පාදනය හා සමීක්ෂණ

අයදුම්පත් කැඳවීමෙන් පසුව පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

සම්පූර්ණ ජීව දත්ත තොරතුරු, තම අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකය ද ඇතුළත් කර අයදුම්පත අදාළ සහතිකවල පිටපත් ද සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2026.06.07** දිනට හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය. අයදුම්පත් එවන ලිපි කවරයේ ඉහළ වම් කෙලවරේ " **තිරසර සංවර්ධන නිලධාරී 2026**" ලෙස සඳහන් කර තිබිය යුතුය.

රාජ්‍ය / අර්ධ රාජ්‍ය / ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරනු ලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**නො 35,**
**02 වෙනි මහල,**
**ලේක් හවුස් ගොඩනැගිල්ල,**
**ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.**
**වෙබ් අඩවිය : www.sdc.gov.lk**
**දුරකථන : 0112885241**

**"තිරසර සංවර්ධන පෙර ගමන් සමූහයේ සාඩම්බර සාමාජිකයකු වන්න."**